**අකුරණ ප්‍රාදේශිය සභාව**
**මහනුවර දිස්ත්‍රික්කය**

**-------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන.**

**-----------------**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.**

**--------------------------------**

**සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2014 මාර්තු 31 දින ද ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2013 මාර්තු 27 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2014 දෙසැම්බර් 09 දින ද සභාවේ, සභාපතිවරයාට යවා ඇත.**

**1.2 මතය.**

**------------**

**මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට අකුරණ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.**

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබද අදහස් දැක්වීම.**

**-----------------------------------------**

**1.3.1 ගිණුම්කරණ අඩුපාඩු.**

**-------------------------**

**පහත සදහන් අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.**

**(අ) විගණනයට ඉදිරිපත් කළ ලේඛනයේ ඉඩම්වල වටිනාකම් මූල්‍ය ප්‍රකාශනවල සදහන් ඉඩම්වල වටිනාකම් සමග සැසදීමේ දි ඉඩම් 36 ක වටිනාකම වූ රු.1,613,668 ක් ගිණුම්ගත කර නොතිබුණි.**

(ආ) පිරිවැය රු.1,500,000 ක් වූ අංක 252-6527 දරන කැබ් රථය 2013 වර්ෂයේ දි රු.3,133,447 ක වියදමකින් අලුත්වැඩියා කර තිබූ අතර, එහි නව වටිනාකම තක්සේරු කර, ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) 2012 වර්ෂයේ විගණකාධිපති වාර්තාවෙන් නිරීක්ෂණය කර තිබූ ගිණුම්ගත නොකළ රු.26,652 ක හිග ජල ගාස්තු සමාලෝචිත වර්ෂයේ දීද, ගිණුම්වල ගැළපිමට කටයුතු කර නොතිබුණි.

1.3.2 ලැබියයුතු හා ගෙවියයුතු ගිණුම්.

-------------------------------------

(අ) ලැබියයුතු ගිණුම්.

---------------------

2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකශන වලින් ඉදිරිපත් කර තිබූ ලැබියයුතු ගිණුම් ශේෂවල එකතු වටිනාකම රු.127,883,524 ක් වූ අතර, එයින් ආදායම් විෂයයන් 06 ක අවුරුදු 01 ට වැඩි කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂයන් හී එකතු වටිනාකම රු. 3,696,445 ක් වී තිබුණි.

(ආ) ගෙවියයුතු ගිණුම්.

-------------------

2013 දෙසැම්බර් 31 දිනට එකතුව රු.117,120,733 ක් වූ ගෙවියයුතු ගිණුම් ශේෂවල වටිනාකමින් අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් විෂයයක වටිනාකම රු.168,443 ක් විය. එම ශේෂයෙන් 2014 අගෝස්තු 22 දින වන විට තවදුරටත් රු.21,275 ක් ගෙවියයුතුව තිබුණි.

2. මූල්‍ය සමාලෝචනය.

---------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල.

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.17,441,899 ක් වූ

අතර, ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.6,076,356 ක් වුයෙන්, මූල්‍ය ප්‍රතිඵලවල රු.11,365,543 ක වර්ධනයක් දක්නට ලැබුණි.

**2.2** කාරක ප්‍රාග්ධන කළමනාකරණය.

-----------------------------------

මුලු ජංගම වත්කම් සමග ජංගම වගකීම් අතර අනුපාතය 1.22:1 වු අතර, පසු ගිය වර්ෂයේ අනුපාතය 1.19:1 ක් විය. මෙම අනුපාතය ප්‍රශස්ථ මට්ටමක නොපවතින බව නිරීක්ෂණය වු අතර, සමස්ත ජංගම වත්කම්වලින් සියයට 70 ක් හෙවත්, රුපියල් මිලියන 107 ක් පළාත් පාලන යටිතල පහසුකම් වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතියෙන් (LGIIP) අය වියයුතු මුදල වන අතර, මුලු ජංගම වගකීම්වලින් සියයට 90 ක් හෙවත්, රුපියල් මිලියන 106.7 ක් ලංකා ට්‍රේඩින් කන්ස්ට්‍රක්ෂන්ස් සමාගමට ගෙවියයුතු වටිනාකමින් සමන්විත වී තිබුණි.

**2.3** ආදායම් පරිපාලනය.

---------------------

(අ) වරිපනම් බදු

--------------

සමාලෝචිත වර්ෂය ආරම්භක දිනට රු.1,791,977 ක හිගයක් පැවති අතර, වර්ෂයේ බිල් කිරීම්වලින් අය කිරීම රු.4,514,513 ක් වුයෙන්, අය කිරීමේ ප්‍රතිශතය සියයට 68 ක් වී තිබුණි.

2013 දෙසැම්බර් 31 දිනට අය වියයුතු රු.3,004,309 ක ශේෂය සම්බන්ධයෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158(1) හා 159(1) වගන්තිවල විධිවිධාන අනුගමනය කර 2014 ජුනි 30 දින වන විටත් හිග ආදායම් අය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) බදු කුළී.

----------

2013 දෙසැම්බර් 31 දින වන විට කඩ කාමර 29 ක මාස 06 සිට වසර දහයක පමණ කාල පරාසයක් සඳහා රු.551,142 ක කුළී අය වියයුතු

වුවත්, කඩ කුළී හිග හිටි කඩ කාමර සම්බන්ධයෙන් ගිවිසුම් ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ඈ) සම්ප්‍රේෂණ කුළුණු ගාස්තු

-------------------------------

සභා බල ප්‍රදේශය තුළ ඉදි කර තිබුණු දුරකථන සම්ප්‍රේෂණ කුළුණු 04 න් සමාලෝචිත වර්ෂය සඳහා වෙළඳ බලපත්‍ර ගාස්තු රු.12,000 ක් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) දැන්වීම් පුවරු ගාස්තු.

------------------------

නගරය තුළ ස්ථානගත කර තිබුණු ස්ථාවර දැන්වීම් පුවරු 08 කින් ඊට අදාළ ආයතන වෙතින් රු.202,300 ක ගාස්තු අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය.

--------------------------

3.1 කාර්ය සාධන ඇගයීම

-----------------------

වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුකූලවීම තහවුරු කරගැනීම සඳහා භෞතික හා මූල්‍ය කාර්යය සාධනය දැක්වෙන ප්‍රගති වාර්තා හා පාලන වාර්තා පිළියෙල කර නොතිබුණි.

3.2 කොන්ත්‍රාත් පරිපාලනය.

-----------------------------

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2013 දෙසැම්බර් 14 වන දින රු.366,868 ක වටිනාකමකින් නිම කරන ලද දොඩම්ගොල්ල හරස් මාර්ගයේ ස්ථාන 02 ක එකතුව වර්ග අඩි 55 ක ප්‍රමාණයක අන්තර් සම්බන්ධිත කුට්ටි ගල් අතුරා තිබුණු ප්‍රදේශයක් ගිලා බැස තිබුණි.

(ආ) නීත්‍යානුකූලව සභාවට පවරා නොගත් පෞද්ගලික මාර්ගයක් වන බුළුගොහොතැන්න මහ පල්ලිය අසළින් යන අතුරු මාර්ගය කොන්ක්‍රීට් කිරීම සඳහා රු.142,500 ක් සභා අරමුදලින් වැය කර තිබුණි.

3.3 අවිධිමත් ගනුදෙනු

--------------------

සභාවේ කාර්යයන් සදහා කුළී පදනම මත යොදවා ගෙන තිබුණු අංක HC 6094 දරන වාහනය වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළ රු.115,000 ක් කුළී මුදල් ගෙවා තිබුණු නමුත්, එම වාහනය සභාවේ කුමන කාර්යයක් සදහා යොදවා ගෙන තිබුණේ ද යන්න තහවුරු කර ගත නොහැකි විය. එමෙන්ම, වාහනයට අදාළ ධාවන සටහන් හී ගමන් විස්තරය ද දක්වා නොතිබුණි.

3.4 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්.

------------------------------------------

සභාව සතු අකුරණ නගර මධ්‍යයේ පිහිටි පොදු වෙළද සංකීර්ණයේ කඩ කාමර 12 ක් වසර 02 ක පමණ කාලයක සිට කුළියට දීමට හෝ වෙනත් ඵලදායී කාර්යයකට යොදවා ගැනීමකින් තොරව වසා දමා තිබුණි.

3.5 මෙහෙයුම් අකාර්යක්ෂමතා.

---------------------------------

අලවතුගොඩ කෙනකලගල මාවතුපොළ පිහිටි සුදු හකුරුවත්ත නමැති වෙන්දේසියේ විකුණනු ලබන ඉඩමෙන් විකුණුම් මත අය කරනු ලබන බදු මුදල් හා පොදු කටයුතු සදහා සභාව වෙත පැවරියයුතු ඉඩම් කොටස් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

**4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය.**

**---------------------------------------**

**4.1 සංයුක්ත සැළැස්ම.**

**---------------------**

**සමාලෝචිත වර්ෂයේ දි සභාවේ සංයුක්ත සැළැස්මක් පිළියෙළ කර නොතිබුණි.**

**4.2 ප්‍රසම්පාදන සැළැස්ම.**

**-------------------------**

**රු.73,115,724 ක ප්‍රාග්ධන වියදම් සභාව දරා ඇති නමුත්, සමාලෝචිත වර්ෂය සදහා ප්‍රසම්පාදන සැළැස්මක් සකස් කර නොතිබුණි.**

**4.3 ක්‍රියාකාරී සැළැස්ම.**

**---------------------**

**සභාව විසින් සමාලෝචිත වර්ෂයේ දි ක්‍රියාකාරී සැළැස්මක් සකස් කර නොතිබුණි.**

**4.4 අභ්‍යන්තර විගණනය.**

**----------------------**

**සමාලෝචිත වර්ෂයේ දි සභාවේ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි.**

**4.5 අයවැය පාලනය.**

**------------------**

**පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.**

**(අ) සමාලෝචිත වර්ෂය සදහා පිළියෙළ කර තිබුණු අයවැය ලේඛනයට අනුව, ඇස්තමේන්තුගත ආදායම් හා වියදම්, තථ්‍ය ආදායම් හා වියදම් සමග**

සැසඳීමේ දි ආදායම් විෂයයන් **06** ක සියයට **15** සිට සියයට **81** ක් දක්වා ද, වියදම් විෂයයන් **08** ක සියයට **23** සිට සියයට **63** දක්වා ද විචලනයන් නිරීක්ෂණය වු අතර, අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් වශයෙන් යොදා ගෙන නොතිබු බව නිරීක්ෂණය විය.

(ආ) ආදායම් ශීර්ෂ **05** කට අයත් උප අය විෂයයන් **09** ක් සඳහා අය වැයගත කළ රු.**1,839,250** ක ආදායම් අය වීමේ ප්‍රතිශතය සියයට **0** ක් විය.

**5.** පද්ධති හා පාලන

--------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් පරිපාලනය

(ඇ) මානව සම්පත් කළමනාකරණය.